සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| චිත්‍ර | I |
| சித்திரம் | I |
| Art | I |

2018.12.11 / 0830 - 0930

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |
| II | |
| III | |
| එකතුව | |
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| ගණිත පරීක්ෂක | |

※ **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**විභාග අංකය** : ........................................

● පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** මෙම වාස්තු විද්‍යා නිර්මාණය ........................................ විහාර භූමියේ පිහිටා ඇත.

**2.** මෙය ........................................ යුගයේ බුවනෙකබාහු රජ සමයේ ඉදිකරන ලදි.

**3.** මෙම අපූර්ව නිර්මාණය ........................................ නමින් හැඳින්වේ.

**4.** මෙය ද්‍රවිඩ වාස්තු විද්‍යා ශිල්පාචාරීවරයකු වූ ........................................ ශිල්පියා විසින් නිම කරන ලද්දකි.

**5.** සතර දිසාවට මුහුණලා ඇති අයුරින් තනා ඇති ........................................ සතර මත පරිවාර චෛත්‍ය සතරක් ඉදිකර ඇත.

[දෙවැනි පිටුව බලන්න.

www.ehelpmate.com

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** බටහිර ස්වාභාවිකවාදී චිත්‍ර ශෛලීය ආභාසය අනුව නූතන විහාර සිතුවම් ඇඳීමේ පුරෝගාමී ශිල්පියා කවු ද?

..............................................................................................................

**7.** A. මාර්ක් ශිල්පියා විසින් ඉවතලන ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණය කරන ලද මූර්තිය කුමන නමකින් හැඳින්වේ ද?

..............................................................................................................

**8.** කාන්තා රූප යොදාගනිමින් කළයක හැඩයට අනුව සම්පිණ්ඩනය කර ඇති පාරම්පරික සැරසිලි මෝස්තරය කුමන නමකින් හැඳින්වේ ද?

..............................................................................................................

**9.** 'පුංචි සිංඤෝ' නැමති කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා කවු ද?

..............................................................................................................

**10.** කුඩා හිස සහ සරල ව්‍යුක්ත හැඩ භාවිතයෙන් මූර්ති නිර්මාණය කළ යුරෝපීය මූර්ති ශිල්පියා කවු ද?

..............................................................................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට යටින් ඉරක් අඳින්න.

**11.** 'ෆ්‍රෙස්කෝ සිකෝ' යනු,
(1) තෙත බදාමය මත ඇඳීමයි. (2) හුණු මිශ්‍රිත බදාමය මත ඇඳීමයි.
(3) වියළි බදාමය මත ඇඳීමයි. (4) බදාමය මත හුණු ආලේප කර ඇඳීමයි.

**12.** පිත්තල භාණ්ඩ නිර්මාණකරණයේදී විශේෂ වූ පොදුකාර්ය වනුයේ,
(1) වාත්තු කිරීම මගින් භාණ්ඩ නිර්මාණය කිරීමයි.
(2) තහඩු, කැටයම් කිරීමෙන් හා තැළීමෙන් භාණ්ඩ නිර්මාණය කිරීමයි.
(3) එබ්බවීම මගින් භාණ්ඩ සැරසිලි කිරීමයි.
(4) ඔප මට්ටම් කර දීප්තිමත්ව නිම කිරීමයි.

**13.** ඉන්දු නිම්න මූර්ති අතර තත්ත්වාකාර ස්වරූපයට වඩා ශෛලීගත ස්වරූපයක් දැක්වෙන මූර්තිය වනුයේ,
(1) පූජක රුව ය. (2) තලඟන රුව ය.
(3) කවන්ධ රුව ය. (4) නර්තන විලාසයක් දැක්වෙන කවන්ධ රුව ය.

**14.** මිසර කලා නිර්මාණ අතර හමුවන 'ස්පින්ක්ස්' රුව,
(1) මිසර වැසියන් ඇදහූ බලවත් දෙවියකුගේ පිළිරුවකි.
(2) පාරා රජෙකු නිරූපිත සුවිසල් මූර්තියකි.
(3) හුණු ගල් කුට්ටි භාවිතයෙන් ගොඩනැගූ මූර්තියකි.
(4) පාරාවරුන්ගේ තෙද බල මහිමය නිරූපිත කල්පිත මූර්තියකි.

**15.** ශ්‍රී ලංකාවේ ආදිවාසීන්ගේ ලෙන් සිතුවම්
(1) මානව හා සත්ත්ව රූ සංකේතවත්ව ඇඳ ඇත.
(2) සතුන්ගේ සැබෑ චලන ඉරියව් නිරූපණය කර ඇත.
(3) විසිතුරු වර්ණයන්ගෙන් අලංකාර කර ඇත.
(4) සත්ත්ව රූ නිරූපණයට පමණක් සීමා වී ඇත.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** පර්ජන්‍ය : ..............................................................

**17.** පායම් පෑහීම : ..............................................................

**18.** පාර්ශවදර්ශී : ..............................................................

**19.** සිරස්පත : ..............................................................

**20.** උඩළිපත : ..............................................................

[කුන්වැනි පිටුව බලන්න.

www.ehelpmate.com


- අංක **21** සිට **25** තෙක් දී ඇති රූපසටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූපසටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (..........)  **A**

**22.**  (..........)  **B**

**23.**  (..........)  **C**

**24.**  (..........)  **D**

**25.**  (..........)  **E**

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය/වචන යොදා සම්පූර්ණ කරන්න.

**26.** අජන්තාවේ 17 වන ගුහාව තුළ දක්නට ඇති සීගිරි ලලනාවන් සිහිපත් කරවන රූව ........................ නමින් හැඳින්වේ.

**27.** මහධන සිටුවරයාගේ නිවසේ පැවති නැටුම් හා ගැයුම් සංදර්ශනය නිරූපිත සිතුවම පහතරට ........................ විහාරස්ථානය තුළ දක්නට ඇත.

**28.** ග්‍රීක දාර්ශනිකයන්ගේ ක්‍රියාකාරී ඉරියව් නිරූපණය කරමින් සම්පිණ්ඩනය කර ඇති රෆායල්ගේ සිතුවම ........................................................ නමින් හැඳින්වේ.

**29.** ඉනුවිල් පරරාසසේකර පිල්ලෛයාර් කෝවිලෙහි දක්නට ලැබෙන, හින්දු සාහිත්‍යයේ එන කතාපුවත් රැසක් ............................................ ශිල්පියා විසින් සිතුවමට නගා ඇත.

**30.** ඊජිප්තු කලා නිර්මාණවල දැකිය හැකි සාම්ප්‍රදායික ලක්ෂණවලින් මිදී නිර්මාණය වී ඇති නව රාජධානි යුගයේ හමුවන කාන්තා මූර්තිය ........................................... නමින් හැඳින්වේ.


/හතරවැනි පිටුව බලන්න.

eHELPMATE
www.ehelpmate.com

● අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.




F




G



H



I



J

31. **F** අක්ෂරයෙන් දැක්වෙන ශිව දෙවියන්ගේ පතිනිය වන 'ශිව කාමසුන්දරී' වඩාත් ප්‍රචලිත වන්නේ .................................. නමිනි.

32. **G** අක්ෂරයෙන් දැක්වෙන පිළිරුව පොළොන්නරුවේ .......................................... භූමියේ දක්නට ඇත.

33. **H** අක්ෂරයෙන් දැක්වෙන ........................... පිළිරුව ෆීඩියස් විසින් නිර්මිත සුවිසල් මූර්තියකි.

34. **I** අක්ෂරයෙන් දැක්වෙන 'නම් නොකළ' යනුවෙන් නම් කර ඇති පිළිරුව ශ්‍රී ලාංකේය ශිල්පී .................................. ගේ නිර්මාණයකි.

35. **J** අක්ෂරයෙන් දැක්වෙන අනුරාධපුර යුගයේ දී 'මුරගල' සංකල්පය පරිණතියට පත්වූ අවස්ථාව නිරූපිත මෙම කැටයම ............................................................ ඉදිරියේ පිහිටා ඇත.

● ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උපමාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න.

36. ස්ථානය හා තේමාව : ..............................................................................................

..............................................................................................

37. ශිල්පියා : ..............................................................................................

..............................................................................................

38. සම්පිණ්ඩනය : ..............................................................................................

..............................................................................................

39. ආභාසය : ..............................................................................................

..............................................................................................

40. භාව ප්‍රකාශනය : ..............................................................................................

..............................................................................................

* * *

HELPMATE
www.ehelpmate.com

102536

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| චිත්‍ර | II |
| சித்திரம் | II |
| Art | II |

2018.12.11 / 1315 - 1515

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**

* ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ භාවිත කළ හැකි ය.
* සියලු ම ද්‍රව්‍ය ඇස් මට්ටමෙන් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

* ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති රළු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිත කරන්න.

* **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**
* ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා
6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

**සැලකිය යුතුයි:**

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නො වේ. ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

* * *

eHELPMATE
www.ehelpmate.com

eHELPMATE
www.ehelpmate.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

චිත්‍ර III
சித்திரம் III
Art III

2018.12.11 / 0945 - 1145

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**සැලකිය යුතුයි :**

* ඔබ ඇඳිය යුත්තේ **එක** චිත්‍රයක් පමණි.
* ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
* ඇඳීමේ සුදු කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් මාතෘකාවක් පමණක් තෝරාගන්න.**

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. පෙරහැරේ අලි කුලප්පුවක්
2. නිවසේ පැවැත්වෙන ආගමික කටයුත්තක්
3. ධීවර වෙළෙඳපොළක්/පදික වෙළෙඳුන්
4. නානතොටේ සොඳුරු කතාබහ

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. සරල සත්ත්ව හැඩතල භාවිතයෙන් චිත්‍ර රෙද්දක් මුද්‍රණය කිරීම සඳහා ව්‍යාප්ත මෝස්තරයක අඟල් 9 × 9 ප්‍රමාණයේ කොටසක් ඇඳ චමත්කාරයක් දනවන පරිදි වර්ණ කරන්න. මෝස්තර කොටස ව්‍යාප්ත වන අයුරු ගැන සැලකිලිමත් වන්න.
6. අඩි 8 × 6 ප්‍රමාණයේ ඇඳ ඇතිරිල්ලක් සඳහා මුලුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.
7. බතික් ක්‍රමයට වර්ණ කළ හැකි පරිදි අඩි 4 ක් උස අඩි 2 ක් පළල බිත්ති සැරසිල්ලක් නර්තන විලාස දැක්වෙන මානව රූ **දෙකක්** ඇසුරෙන් නිර්මාණය කරන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. 'පුංචි සිත්තරා' නමින් පළවන ළමා පොතක් සඳහා පිට කවරයක් නිර්මාණය කරන්න.
9. "උගතමනා ශිල්පයමැයි මතු රැකෙනා" මැයෙන් අධ්‍යාපනයේ අගය පැහැදිලි වන සේ විචිත්‍රවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
10. 'අම්මා' පිළිබඳ ලියවුණු නිසඳැස් කාව්‍යයකට සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් සැලසුම් කරන්න.

* * *

eHELPMATE
www.ehelpmate.com

eHELPMATE
www.ehelpmate.com

OL/2018/43-I

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

102536

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

චිත්‍ර I / சித்திரம் I / Art I



* * *

eHELPMATE
www.ehelpmate.com

HELPMATE
www.ehelpmate.com